344

RARE

# ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නය විසඳීමේ ක්‍රමෝපායක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයෙහි කාර්යභාරය පිළිබඳ විග්‍රහයක්

එන්.ජී. රත්නායක

බී.ඒ. (ආර්ථික විද්‍යාව, විශේෂවේදී), පශ්චාත් උපාධි/ඩිප්ලෝමා (උපදේශනය)

FGS/1998/E/138/R

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී.

2002 ජූලි

ප්‍රවේශ අංකය 344
වර් අංකය

## නිබන්ධන සාරාංශය


ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය සමාජ, ආර්ථික හා දේශපාලන ගැටළු රැසක්ම ඇතිකිරීමට හේතුවී තිබෙන දැවෙන ප්‍රශ්නයකි. මෑතක් වනතෙක්ම මෙම ගැටළුව විසඳීම සඳහා රාජ්‍ය අංශයේ රැකියා ලබාදීම සිදුවුවත්, අපේක්ෂිත සියල්ලටම රැකියා සැපයීමට අපොහොසත්වීම නිසා, වර්තමානයේ ඊට විකල්ප ක්‍රියාමාර්ග විමර්ශනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

"සේවා වියුක්තිය" පිළිබඳව විවිධ රටවල් හා ජාත්‍යන්තර සංවිධාන, විවිධාකාරයේ අර්ථනිරූපන ඉදිරිපත් කර ඇති අතර, අප රටේද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් දෙයාකාරයක අර්ථ නිරූපන ඉදිරිපත් කර තිබේ. විශේෂයෙන්ම "වයස් සීමාවන්" සහ "දැනට රැකියා නියුක්ත" යන නිර්නායකයන් මතභේදයට තුඩුදී ඇත. නිර්නායකයන්ගේ මෙම ව්‍යාකූල බව නිසා 1990 දී 15.9% ක්වූ සේවා වියුක්ති අනුපාතය වසර 2000 දී 7.6% දක්වා ක්‍රමානුකූලව පහළයාමේ ප්‍රවණතාවයක් ඇතැයි ප්‍රකාශ වුවත්, ව්‍යුහාත්මකව විමර්ශනය කර බලන විට එය 9%-10% අතර ප්‍රමාණයක විචලනය වන බව පෙනේ.

ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තියෙහි උපරිම අවස්ථාවන් දැකිය හැකිවන්නේ 1970 න් පසුවය. මෙම කාලයෙන් පසු බලයට පත්වන සෑම රජයක් විසින්ම විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති මේ සඳහා අනුගමනය කලත්, අදල ගැටළුව මුළුමනින්ම විසඳලීමට අපොහොසත් වී ඇත. 1978 න් පසු ඇතිවූ විවෘත ආර්ථික පිළිවෙත් නිසා රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා සංකෝචනයවී, පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ප්‍රසාරණයවීම, වර්තමානය දක්වාම රැකියා වෙළෙඳපොළේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුමට සරිලන සැපයුමක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුලින් බිහිනොවීම නිසාත්, උගත් කණ්ඩායම්වල රැකියා ආකල්ප හා රැකියා වෙළෙඳපොළ අතර නොගැලපීම නිසාත්, (Unemployment mismatch) අදල ගැටළුව තීව්‍රවීමට හේතුවී ඇත.

ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය ආශ්‍රිතව තරුණ අසහනය, සමාජ අපචාර, සියදිවි නසාගැනීම්, මත්ද්‍රව්‍ය භාවිතය වැනි සමාජීය ගැටළු මෙන්ම දරිද්‍රතාවය, ආදයම් බෙදියාමේ විෂමතාවය, පන්ති පරතරය, යැපෙන්නන් ප්‍රමාණය අධිකවීම, ආර්ථික වර්ධනය පසුබෑම වැනි ආර්ථික ගැටළුද, තරුණ අරගල, නීතිය හා සාමය කඩවීම, ජීවිත හානි සිදුවීම හා දේපල විනාශවීම වැනි දේශපාලන ගැටළුද ඇතිවී තිබේ.

මෙම ගැටළුවට ක්‍රමෝපායක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනය යොදගැනීම සංවර්ධිත රටවල් මෙන්ම, සංවර්ධනය වෙමින් පවතින රටවල්ද භාවිතා කරන උපාය මාර්ගයකි. එබැවින් ව්‍යවසායකත්ව සංවර්ධන සංකල්පය මෑතභාගයේදී බොහෝ රටවල ජනප්‍රියවෙමින් පවත්නා නවීන විෂය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්විය හැකිය. එසේම අනිකුත් විෂයයන් මෙන්ම, ව්‍යවසායකත්ව සංවර්ධනයෙහිද, අර්ථනිරූපන, ඓතිහාසික වර්ධනය, මූලිකාංග, ක්‍රියාවලි හා සංවර්ධන ආකෘති වැනි න්‍යායාත්මක මූලධර්ම දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ මූලික ඉඟි 1982 දී පමණ දැකිය හැකි වුවත්, එහි දීපව්‍යාප්ත ප්‍රායෝගික ක්‍රියාකාරකම් 1987 න් පසු පැහැදිලිව දක්නට ලැබුනි. විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ආශ්‍රිතව දියත්කල "ඒකාබද්ධ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන" මගින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතුවල පුනර්ජීවයක් ඇතිවිය. ආරම්භයේදී රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන පමණක් මෙම කටයුතුවල නියැලී සිටි අතර, වර්තමානයේදී රාජ්‍ය නොවන ආයතනද කැපීපෙනෙන කාර්යභාරයක් ඉටුකරයි. දැනට ශ්‍රී ලංකාවේ ආයතන 10 ක් පමණ ක්ෂේත්‍රයට අදල කටයුතුවල නිරතවී ඇති අතර, ඔවුන් විවිධ මට්ටමේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්, සහාය සේවාවන් හා උපදේශක සේවා පවත්වාගෙන යනු ලැබේ. සහාය සේවාවන් අතර තාක්ෂණික සේවා, මූල්‍ය සේවා හා අලෙවි සේවා ප්‍රමුඛස්ථානයෙහිලා සැලකේ. ව්‍යාපාරික ගැටළු අතුරින් එනම් කළමනාකරණ ගැටළු, අලෙවි ගැටළු, මූල්‍ය ගැටළු, සේවක ගැටළු හා තාක්ෂණික ගැටළු විසඳගැනීම සඳහා ව්‍යාපාරික උපදේශක සේවාවන්ද මෙම ආයතන විසින් පවත්වාගෙන යනු ලැබේ.

ගැටළුවට අදල තොරතුරු රැස්කිරීමේදී ඍජු ක්‍රමවේදය මෙන්ම වක්‍ර ක්‍රමවේදය යටතේද තොරතුරු රැස්කර ඇත. ඍජු ක්‍රමවේදය යටතේ ප්‍රශ්නාවලියක් මගින් "පවතින

ව්‍යවසායකයින්" 50 දෙනෙකුගේ සහ "නව ව්‍යවසායකයින්" 50 දෙනෙකුගේ තොරතුරු ලබාගෙන ඇත. වක්‍ර ක්‍රමවේදය යටතේ ප්‍රත්‍යයෙක අධ්‍යයන 05 ක් මගින්ද, අදාල ක්ෂේත්‍රයේ කටයුතු කරන ආයතන 10 ක අත්දකිම්ද ක්ෂේත්‍රයට අදාල අධ්‍යයන වාර්තා 04 කද තොරතුරු ඉදිරිපත් කර ඇත.

මෙම ඍජු හා වක්‍ර තොරතුරු විශ්ලේෂණය කිරීමේදී වැදගත් නිගමන කීපයකට එළඹීමට හැකිවී තිබේ.

(1) ව්‍යවසායක ගුණාංග වලින් හෙබි පුද්ගලයන් හඳුනාගැනීමෙන් ඔවුන් ව්‍යවසායකයන් ලෙස සංවර්ධනය කළහැකි බව

(2) ව්‍යවසායකත්වය සඳහා අධ්‍යාපනය, වයස, සමාජ පන්තිය, තරාතිරම යනාදීන්ගේ දැඩි බලපෑමක් නොමැතිබව

(3) කුමන හෝ වෘත්තිය පුහුණුවක් හෝ පළපුරුද්දක් ලබාතිබීම ව්‍යවසායකත්වයට එළඹීමට පසුබිම සැකසෙන බව

(4) ව්‍යවසායකත්වයට පත්වූ පුද්ගලයින්ගෙන් 87% ක්ම ඒ පිළිබඳව තෘප්තිමත්වන බව

(5) ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රය තුලින් ඍජුවම හා වක්‍රව රැකියා උත්පාදනය කළහැකි බව

(6) පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමෙන් හා නව ව්‍යාපාර ඇරඹීමෙන් රැකියා අවස්ථා ජනිතවන බව

(7) රැකියා විරහිත තරුණ තරුණියන් මෙම ක්ෂේත්‍රයට අභිප්‍රේරණය කළහැකි බව

(8) ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ කටයුතු කරන ආයතන සීමිතවීම හා රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බව

(9) රැකියා වියුක්තියට ක්‍රමෝපායක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනය යොදගත හැකි බව